වාලම්පුරියක් ලක්ෂ 50 කට විකිණීමට තැත් කළ අයෙකු අත්අඩංගුවට ගෙන ඇත - මාධ්‍ය (ඔක්. 05, 2022/ ඔක්. 06, 2022)

සිදුවීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනුණු පුද්ගලයාව විවිධ මාධ්‍ය හඳුන්වා දී ඇත්තේ මෙසේයි:

දිවයින (ඔක්. 06, 2022) - සරසවි සිසුවා (පොලිස් මූලාශ්‍ර ඔස්සේ තොරතුරු ලබාගෙන ඇති බවක් පෙනී යයි).

දිනමිණ (ඔක්. 06, 2022) - සරසවි සිසු වෙස් ගත් අයෙක් (පොලිස් මූලාශ්‍ර ඔස්සේ තොරතුරු ලබාගෙන ඇති අතර, විශ්වවිද්‍යාල පාලනාධිකාරිය ඔස්සේ තොරතුරු තහවුරු කරගෙන ඇත).

මව්බිම (ඔක්. 05, 2022) - සරසවි සිසුවෙක් නොවේ (පොලිස් මූලාශ්‍ර ඔස්සේ තොරතුරු ලබාගත් බවක් පෙනී යන අතර, විශ්වවිද්‍යාල පාලනාධිකාරිය ඔස්සේ තොරතුරු තහවුරු කරගෙන ඇත).

1) හැකි උපරිම ලෙසින් නිරවද්‍යව පුවත් ඉදිරිපත් කිරීම, මාධ්‍යකරණයේ ප්‍රමුඛ කොන්දේසියකි. එසේ නම් මෙම පුවත් අතුරින්, වඩාත් විශ්වසනීය හා නිරවද්‍ය පුවත/පුවත් ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන ඒවා ද?

2) විශ්වසනීය මූලාශ්‍ර/බහු මූලාශ්‍ර යොදාගනිමින්, පුවතෙහි තොරතුරු තහවුරු කරගන්නට කටයුතු කළේ නම්, වඩාත් නිරවද්‍ය පුවතක් ඉදිරිපත් කිරීමට ඉඩ නොලැබෙන්නේ ද?

විශ්වසනීය සහ බහු මූලාශ්‍ර ඔස්සේ තහවුරු කරගත් තොරතුරුම පළ කරමු!